3831

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2014
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 09 | විෂයය / பாடம் / Subject: ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- .............................................. විභාග අංකය :- ..............................

සැලකිය යුතුයි:

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් සුදුසු පිළිතුර තෝරා එයට අදාළ අංකය තිත් ඉර මත ලියන්න.

## I කොටස

(01) 'බහුවිධ බුද්ධි න්‍යාය' ලොවට හඳුන්වා දුන්නේ,

(1) මහාචාර්ය ඇල්ෆ්‍රඩ් වෙග්නර් ය.
(2) මහාචාර්ය හොවාඩ් ගාඩ්නර් ය.
(3) මහාචාර්ය මාටින් ලූතර් ය.
(4) මහාචාර්ය ඇඩම්ස් ස්මිත් ය.

(02) 'අකුරට ඔබ වන්න දාස - අකුර ඔබට වේය දාස' මෙම ප්‍රකාශය කරනු ලැබුවේ,

(1) මුනිදාස කුමාරතුංගයන් ය.
(2) මහගම සේකරන් ය.
(3) පියදාස සිරිසේනයන් ය.
(4) රපියෙල් තෙන්නකෝන්ය.

(03) 'ජල විදුලියේ පියා' නමින් විරුදාවලිය ලැබූ අභිමානවත් ශ්‍රී ලාංකිකයා වනුයේ,

(1) සෙනරත් පරණවිතාන මහතා ය.
(2) ඩී. ඩබ්ලිව්. විමලසුරේන්ද්‍ර මහතා ය.
(3) ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ මහතා ය.
(4) ඒ. ඩබ්ලිව්. අදිකාරම් මහතා ය.

(04) දෙවන ලෝක යුද්ධය නිසා ලොව පුරා වෙසෙන මිනිසුන්ට සිදු වූ විනාශය හේතුවෙන් ලෝක සාමය හා සහජීවනය ගොඩනැගීමේ අරමුණින් පිහිට වූ සංවිධානය

(1) එක්සත් ජාතීන්ගේ සංවිධානයයි.
(2) අන්තර් ජාතික මූල්‍ය අරමුදලයි.
(3) ලෝක සෞඛ්‍ය සංවිධානයයි.
(4) අන්තර් ජාතික කම්කරු සංවිධානයයි.

(05) 'පොතක පිටු අතර සැබෑ මිනිස්සු ජීවත් වෙති' යන ප්‍රකාශය කරනු ලැබුවේ,

(1) ප්‍රැන්සිස් බේකන් ය.
(2) ශ්‍රීමත් රිචඩ් ස්ටීල් ය.
(3) ලියෝ ටෝල්ස්ටෝයි ය.
(4) ඊ. එම්. ෆෝස්ටර් ය.

- අංක 06 සිට 10 දක්වා දී ඇති වගන්ති හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

(06) ලෝක පූජිත 'අගා-ඛාන්' සම්මානයෙන් පිදුම් ලැබූ ජෙෆ්රි බාවා පරිසර හිතකාමී වාස්තු විද්‍යාඥයකු විය. ( )

(07) මැක්සිම් ගෝර්කි නමැති රුසියානු ලේඛකයාගේ නිර්මාණශීලි පන්හිඳ රුසියානු පාලනයට අභියෝගයක් විය. ( )



167

(08) තම හැකියා හඳුනා ගැනීම පමණක් වෘත්තීය ක්ෂේත්‍රයක් තෝරා ගැනීමේ දී ප්‍රමාණවත් ය. ( )

(09) පවුලකින් සමාජ සුරක්ෂිතාව සඳහා ලබා දිය හැකි යහපත් පණිවිඩය වනුයේ අපි යන හැඟීම වර්ධනය කිරීමයි. ( )

(10) ඉංග්‍රීසි පාලන සමයේ දී කොළඹ නගරයේ ආරක්ෂාව සඳහා පොලිස් සේවය ආරම්භ විය. ( )

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට සුදුසු වචනය වරහන් තුළින් තෝරා ලියන්න.

(තාරකා විද්‍යාව , සී. ඩබ්. ඩබ්. කන්නන්ගර , යුනෙස්කෝ , ඉන්දියාව , ජපානය , සර්වජන , ඊ. ඒ. නුගවෙල , කොරියාව)

(11) තීරණ ගැනීම සම්බන්ධයෙන් අමතක කළ නොහැකි ශ්‍රී ලාංකික අධ්‍යාපනඥයෙක් ලෙස .................................. මැතිතුමා හැඳින්විය හැකි ය.

(12) යුද්ධය හට ගන්නේ මිනිසුන්ගේ සිත් තුළ බැවින් සාමයේ පවුර ඉදි කළ යුත්තේ ද මිනිසුන්ගේ සිත් තුළ ය. මෙම ප්‍රකාශය ඇතුළත් වන්නේ .................................. ව්‍යවස්ථාවෙහි ය.

(13) .................................. ලොවට දායාද කළේ මෙසපොතේමියානු ශිෂ්ටාචාරයයි.

(14) ශ්‍රී ලාංකිකයන්ට ක්‍රි.ව. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යටතේ .................................. ඡන්දබලය හිමි විය.

(15) පංචවිධ සංකල්පය ලොවට හඳුන්වා දෙනු ලැබූ රට .................................. යයි.

- අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට සුදුසු පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.

(16) විවිධ නිපුණතාවලින් සපිරි නිර්මාණශීලී පුද්ගලයන් සඳහා .................................. තුළ ප්‍රබල ඉල්ලුමක් ඇත.

(17) 'එකා සැමටත් - සැම එකාටත්' යනු .................................. ව්‍යාපාරයේ ආදර්ශ පාඨයයි.

(18) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රථම ශ්‍රී ලාංකික පුරාවිද්‍යා කොමසාරිස්වරයා වූයේ .................................. මහතා ය.

(19) තාක්ෂණික වෙනස්වීම් මිනිසා නිර්මාණශීලීව යොදා ගනු ලැබුවත් එය සමාජයට .................................. අන්දමින් මෙන් ම .................................. අන්දමින් ද බලපෑ හැකි ය.

(20) ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රධාන ලක්ෂණයක් වන්නේ පුරවැසියන් සැමට සමාන .................................. හිමි වීම ය.

(2 x 20 = ලකුණු 40)

## II කොටස

◆ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.

(01) 'පොදු යහපතට හේතු වන පළාත් පාලන ආයතනවල කටයුතුවලට සහාය දැක්වීම' යන මාතෘකාව යටතේ ප්‍රශ්නෝත්තර සංග්‍රහයක් නිර්මාණය කිරීම ඔබ කණ්ඩායමට පැවරෙන කාර්යයයි.

(1) ප්‍රශ්නෝත්තර සංග්‍රහය සැකසීම සඳහා ගුරුතුමා / තුරුතුමියගෙන් ඔබට ලැබුණ උපදෙස් දෙකක් ලියන්න. (ලකුණු 02)

(2) තොරතුරු රැස් කිරීම සඳහා පෙළ පොතට අමතරව ඔබ යොදා ගත් මූලාශ්‍ර දෙකක් ලියන්න. (ලකුණු 02)

(3) ඔබ ජීවත් වන ප්‍රදේශයට අයත් පළාත් පාලන ආයතනය නම් කරන්න. (ලකුණු 01)

(4) එම ආයතනයෙන් ඉටු කරන කාර්යයන් තුනක් ලියන්න. (ලකුණු 03)

(5) ප්‍රශ්නෝත්තර සංග්‍රහය සැකසීමේ දී ඔබට මුහුණ දීමට සිදු වූ ගැටළු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(6) එම ගැටළු අවම කර ගැනීම සඳහා ඔබ හා ඔබේ කණ්ඩායමේ සාමාජිකයන් ගනු ලැබූ ක්‍රියාමාර්ග තුනක් ලියන්න. (ලකුණු 03)

(7) ඔබට සිතෙන පරිදි එවැනි ආයතන සමාජයට අවශ්‍ය වන්නේ ඇයි දැයි වාක්‍ය තුනකින් ලියා දක්වන්න. (ලකුණු 03)

(මුළු ලකුණු 16)

(02) (1) ශිෂ්‍යයෙකුට තමා සතු හැකියා වැඩි දියුණු කර ගැනීම සඳහා යොදා ගත හැකි ඉගෙනුම් ක්‍රම දෙකක් ලියන්න. (ලකුණු 02)

(2) තම බුද්ධිමය හැකියා ජීවිත සාර්ථය සමඟ එක් කළ පුද්ගලයන් කිහිප දෙනෙකු පහත දැක්වේ. ඔවුන් හඳුනාගෙන නම් කරන්න. (ලකුණු 04)

(1)  (2)  (3)  (4) 

(3) බුද්ධිමත්තු තමන්ට ශාරීරික මානසික පීඩා ලබාදුන් කටුක අත්දැකීම් උපයෝගී කරගෙන උසස් නිර්මාණ බිහිකර ඒවා ලොවට දායාද කළෝ ය. මෙම අදහස නිදසුන් දෙකක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(03) (1) ස්ථිරසාර ලෙස කටයුතු කිරීමට සිදුවන අවස්ථා දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) ස්ථිරසාරතාව සඳහා ප්‍රගුණ කළයුතු ගුණාංග හතරක් ලියන්න. (ලකුණු 04)

(3) සුබවාදී සිතුවිලි දෙකක් ලියා සුබවාදීව සිතීම නිසා පුද්ගලයකුට අත්පත් කර ගත හැකි වාසි පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 05)

(04) (1) අනතුරු හා විපත් ඒවා සිදුවීමට බලපාන හේතු අනුව ද කොටස් දෙකකට බෙදිය හැකි ය. ඒවා නම් කරන්න. (ලකුණු 02)

(2) භෞතික හා කාලගුණික සාධක නිසා සිදුවිය හැකි ආපදාවලට උදාහරණ හතරක් ලියන්න. (ලකුණු 04)

(3) අහිතකර පුරුදු හා චර්යාවන් නිසා ද අනතුරු සිදුවේ. එවැනි අනතුරුවලට නිදසුන් දෙකක් ලියා එම තත්ත්වය වළක්වා ලීම සඳහා රජය මගින් ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් ලියන්න. (ලකුණු 05)

(05) (1) සමාජ සුරක්ෂිතාව ඇති කිරීම සඳහා පුද්ගලයෙකු සතු වගකීම් දෙකක් ලියන්න. (ලකුණු 02)

(2) සමාජ සුරක්ෂිතතාව බිඳ වැටීමට බලපාන හේතු හතරක් දක්වන්න. (ලකුණු 04)

(3) 1995 දී ජාත්‍යන්තර සමූපකාර සංවිධානය විසින් සමූපකාර ව්‍යාපාරය සඳහා ඉදිරිපත් කළ ප්‍රතිපත්ති දෙකක් දක්වා ඒ පිළිබඳව කෙටියෙන් විස්තරයක් කරන්න. (ලකුණු 05)

(06) (1) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය ක්‍රියාත්මක වන ස්වරූප දෙක නම් කරන්න. (ලකුණු 02)

(2) ශ්‍රී ලාංකික පුරවැසියන්ට ඡන්ද බලය හිමිවීම සඳහා තිබිය යුතු සුදුසුකම් හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(3) ප්‍රජාතන්ත්‍රවාදයේ සාර්ථකත්වයට බලපාන අංග දෙකක් දක්වා ඒවා විස්තර කරන්න. (ලකුණු 05)

(07) (1) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන පළාත්පාලන ආයතන වර්ග තුනකි. ඉන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) පළාත් පාලන ආයතන සීමා නිර්ණය කිරීමේ දී පළාත් පාලන ඇමතිවරයා සැලකිලිමත් වන කරුණු හතරක් ලියන්න. (ලකුණු 04)

(3) සෑම පළාත් පාලන ආයතනයක් ම ස්වකීය මූල්‍ය කටයුතු සඳහා අරමුදලක් පිහිටුවා ඇත. එම අරමුදලට මුදල් ලැබෙන ආකාර දෙකක් ලියා පවතින නීති රීතිවලට යටත්ව එම මුදල් වැය කළ හැකි අවස්ථා තුනක් ලියන්න. (ලකුණු 05)